# සංස්කෘතිය විකිණීම

බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය සිය ආධිපත්‍යය ලෝ පුරා පතුරා ඇත. එහෙත් ඒ සංස්කෘතියට ඇතුල් වීමට එනම් ඒ සංස්කෘතිය තම සංස්කෘතිය බවට පත්කර ගැනීමට කිසිවකුටවත් යුදෙව් ආගම හෝ ක්‍රිස්තියානි ආගම හෝ වැළඳ ගැනීම අවශ්‍ය නො වෙයි. යුදෙව්වන් උපතින් ම යුදෙව් නොවූ අයකුට ආගමින් යුදෙව්වකු වීමට ඉඩ නොදුන් නමුත් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ඇතුල් වීමට ඕනෑම ආගමක් අදහන්නට මෙන් ම කිසිදු ආගමක් නොඅදහන්නේ යැයි කියන්නකුට ද බාධාවක් නැත. මෙය හින්දු, මුස්ලිම් සංස්කෘතීන්ගෙන් ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පෙර තිබූ කතෝලික සංස්කෘතියෙන් ද වෙනස් වෙයි. හින්දු ආදී ඒ ඒ සංස්කෘතීන් ඒ ඒ ආගම් අදහන්නන් සඳහා පමණක් විය.

යුදෙව්වන් වෙනත් අයට යුදෙව්වන් බවට පත්වීමට ඉඩ නොදුන් නමුත් යුදෙව් සංස්කෘතිය පිළිගැනීමට බාධා නොකළා පමණක් නොව ඔවුන්ට බලයෙන් යුදෙව් සංස්කෘතිය පිළිගැන්වීමට කරයුතු කළහ. යුදෙව්වෝ වෙනත් අයට යුදෙව්වන් නොවී යුදෙව් සංස්කෘතිය පිළිගැන්වීමට ක්‍රියා කළහ. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මෙයට වඩා තරමක් වෙනස් වෙයි. බටහිරයෝ වෙනත් අය විවිධ ක්‍රිස්තියානි ආගම්වලට හරවාගැනීමට උත්සාහ කරති. එහෙත් එසේ ක්‍රිස්තියානි ආගමක් වැළඳ නොගත්ත ද යමකුට අවශ්‍ය නම් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ඇතුල්විය හැකි ය. බටහිරයෝ අන් අයට එවැනි නිදහසක් දීමෙන් පමණක් සෑහීමකට පත් නො වෙති. ඔවුහු අන් අය මත යුදෙව්වන් මෙන් ම හැකි ආකාරයෙන් තම සංස්කෘතිය පටවති.

බෞද්ධ සංස්කෘතිය ද ඕනෑම අයකුට බෞද්ධ නොවී ඒ සංස්කෘතියෙහි ජීවත්වීමට අවශ්‍ය නම් ඒ නිදහස ලබා දී ඇත. එහෙත් බෞද්ධයෝ අන් අය තම සංස්කෘතියට ඇතුල් කරගැනීමට උත්සාහ නො කරති. එසේ ගත්විට බෞද්ධ සංස්කෘතිය ඊනියා ලිබරල් සම්ප්‍රදායක් බිහි කෙළේ යැයි කියන බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට වඩා ලිබරල් වෙයි. දරදඬු නීති රීති පද්ධතියකින් වට නොකෙරෙනු සංස්කෘතිය ද බෞද්ධ සංස්කෘතිය වෙයි. අද බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අභියෝග කළ හැකි එක් සංස්කෘතියක් වන්නේ ද බෞද්ධ සංස්කෘතිය ය. අනෙක් සංස්කෘතිය චීන සංස්කෘතිය වෙයි. එහෙත් චීන සංස්කෘතිය ඇසුරෙන් එවැනි අභියෝගයක් එල්ල කිරීමට මෙතෙක් චීන නායකයන් හා උගතුන් සමත් වී ඇති බවක් නො පෙනෙයි.

ලංකාවේ හින්දු, මුස්ලිම් ආදී ඕනෑම සංස්කෘතියකට අයත් ඕනෑම අයකුට සිංහල බෞද්ධ සංස්කෘතියට ඇතුල් නොවී ජීවත්වීමේ නිදහස ඇත. සිංහල බෞද්ධයන් අනෙක් සංස්කෘතීන්ට අයත් ජනයාගෙන් ඉල්ලා සිටින්නේ එක් දෙයක් පමණකි. ඒ මෙරට ප්‍රධාන සංස්කෘතිය සිංහල බෞද්ධ සංස්කෘතිය බව පිළිගැනීම ය. එහෙත් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ඇති මේ ලිහිල් බව දුර්වල කමක් ලෙස සැළකූ බටහිරයෝ මෙරට දෙමළ ජනයාට තම සංස්කෘතිය ප්‍රධාන සංස්කෘතිය ලෙස ගැනීමට අනුබල දුන්හ. එහි දී සිංහල බෞද්ධ සංස්කෘතිය යටපත් කිරීමේ අවශ්‍යතාව ද ඔවුන්ට විය. ඔවුන්ට අවශ්‍ය වූයේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ආධිපත්‍යය මූලික වශයෙන් පවත්වාගෙන යන අතර දෙමළ සංස්කෘතිය දේශීය වශයෙන් ප්‍රධාන සංස්කෘතිය බවට පත්කිරීමටත් දෙමළ වෙල්ලාලයන් මෙරට දේශපාලන, ආර්ථික හා සංස්කෘතික නායකත්වයට පත්කිරීමටත් ය. ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය ඇතිවූයේ බටහිරයන්ගේ මේ අභිලාෂය හේතුකොටගෙන ය.

සිංහල බෞද්ධ සංස්කෘතියෙන් අවශ්‍ය ප්‍රවාද නිර්මාණය නොවුනහොත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යටතේ මුළු ලොවම අගාධයට යනු වැළැක්විය නො හැකි ය. වර්තමානයේ ඇති තාක්ෂණික දියුණුව හුදෙක් ඇස් බැන්දුමක් පමණකි. ඒ තාක්ෂණික දියුණුව පසුපස ඇත්තේ සංකල්පීය න්‍යායික හා ප්‍රවාදාත්මක බංකොළොත් බවකි. මිනිසුන් එකිනෙකාගෙන් හා තම තමන්ගෙන් ද වෙන් වී සමාජයිය භින්නෝන්මාදයකට ගොදුරු වී මුරුගසන් වරුසාවට හසුවූවන් මෙන් එකිනෙකා මරාගන්නා තත්වයකට බටහිර ක්‍රිස්තියානි විසින් ගෙන යනු ලැබීම වැළැක්විය හැක්කේ ථෙරවාද බෞද්ධ සංස්කෘතියකට ය.

© Prof. Nalin De Silva

එහෙත් ඒ හේතුව නිසා ම බටහිරයෝ ථෙරවාදී බෞද්ධ සංස්කෘතීන් නැතිකිරීමට උත්සාහ කරති. බටහිරයන්ට අවශ්‍ය ඔවුන්ගෙ සංස්කෘතිය ලොවෙහි එකම බැරිනම් අධිපතිවාදී සංස්කෘතිය බවට පත්කර (ඔවුන් දැනටමත් එය කර ඇත) හැකිතාක් සම්පත් සූරා කමින් ස්වභාව ධර්මයට ණය වෙමින් ඊනියා දියුණුවක් අත්කර ගැනීම ය. ප්‍රශ්නය බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ය. ධනපති ක්‍රමය එහි එක් අංගයක් පමණකි. ධනපති ක්‍රමයට හෝ එහි ඇතැම් කොටස්වලට හෝ පමණක් විරුද්ධවන මාක්ස්වාදය, ෆැසිස්ට්වාදය වැනි දේශපාලන ධාරාවන්ට ධනපති ක්‍රමයට හෝ එහි කොටස්වලට හෝ එරෙහිව කළහැකි කිසිවක් නැත.

ලෝකයේ එතෙක් මෙතෙක් ඇති වූ සංස්කෘතීන්ගෙන් භයානක ම සංස්කෘතිය වනුයේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යනු ඒ සංස්කෘතියට පසුබිම් වූ සමාජ තත්වය ය. එහි චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය වෙයි. අපි මේ සංස්කෘතියෙහි ඇතැම් ලක්‍ෂණ දැනටමත් සාකච්ඡා කර ඇත්තෙමු. එහි තවත් ප්‍රධාන ලක්‍ෂණයක් සාකච්ඡා කිරීමට මේ අවස්ථාව වෙයි. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සංස්කෘතිය ද විකිණෙයි. බොහෝ විට ඒ විකිණෙන්නේ ලාභයක් ලබා හැනීමට ය.

බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි එක් එක් දෙය අනෙක් දෙයින් වෙන්කිරීමේත් එවා වියුක්ත කිරීමේත් ප්‍රතිඵලය වී ඇත්තේ ඒ ඒ දෑ වියුක්ත භාණ්ඩ බවට පත්වීම ය. මෙය ධනපති ක්‍රමයේ ප්‍රතිඵලයක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයකි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනත් දේ අතර මිනිසාගේ ශ්‍රමය ද මිනිසාගෙන් වෙන්කර එය ද භාණ්ඩයක් බවට පත්කෙළේ ය. ධනපති ක්‍රමය ඇතිවූයේ එලෙස සකස් කරනු ලැබූ පසුබිමක ය.

යමකුට යමක් අලෙවි කළ හැක්කේ ඒ තැනැත්තාගෙන් අලෙවි කරනු ලබන්න වෙන් කෙරී ඇත්නම් ය. වෙන් කෙරී ඊනියා වාස්තවිකත්වයකට පත්කෙරෙන දේ වස්තු හෙවත් භාණ්ඩ බවට පත්වෙයි. මේ ඇතැම් වස්තු හෙවත් භාණ්ඩ පරිභෝජන භාණ්ඩ බවට පත්වෙයි. ඒ පරිභෝජන වස්තු තමන් විසින් ම නිෂ්පාදනය නොකෙරෙන්නේ නම් එක්කෝ හුවමාරුවෙන් ලබාගත යුතු වෙයි. නැතහොත් මිල දී ගතයුතු වෙයි. මිල දී ගැනීම ද එක්තරා ආකාරයකින් ගත්කල හුවමාරුවකි. එහි දී භාණ්ඩයක් හුවමාරුවන්නේ මුදලට ය. මුදල් යනු වියුක්ත සංකේතයකි. එහි ඇත්තේ සංකේතාත්මක වටිනාකමකි. ඒ මුද්‍රණය කර ඇති කඩදාසියේ වටිනාකම හා මුද්‍රණයට යන වියදම සංකේතාත්මක වටිනාකමට වඩා බෙහෙවින් අඩු ය. ඒ අරුතින් ගත්කල මුදල් නෝට්ටු ද අගයක් ඇති භාණ්ඩ වෙයි. එය ද අලෙවි වෙයි. එහි වටිනාකම ද අඩු වැඩි වෙයි. විදේශ විනිමය ලබාගැනීමේ දී මුදල් වෙනත් මුදල්වලට අලෙවිවන ආකාරය තේරුම් ගත හැකි ය.

ඇතැම් වස්තු පරිභෝජන වස්තු නොවී අලෙවි කෙරෙන භාණ්ඩ බවට පත්වෙයි. මුදල් ද ඒ අර්ථයෙන් ගත්කල පරිභෝජනය නොකර අලෙවිකරන භාණ්ඩයකි. ශ්‍රමය ද බොහෝ විට පරිභෝජනය නොකර අලෙවිකරන භාණ්ඩයකි. ශ්‍රමය මුදලට අලෙවි කෙරෙයි. එසේ අලෙවිකර ලබාගන්නා මුදල වැටුප, පඩිය ආදිය වශයෙන් සැලකෙයි. ශ්‍රමය කායික මානසික වශයෙන් දළ වශයෙන් බෙදනු ලැබෙයි. කිනම් වර්ගයකට අයත් වුවත් ශ්‍රමය විකිණෙයි.

ශ්‍රමය පමණක් නොව සංස්කෘතිය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි භාණ්ඩයක් බවට පත් වී ඇත. සංස්කෘතිය යනු පරිභෝජනය කෙරෙන, කළ හැකි භාණ්ඩයකි. සංස්කෘතිය බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි මිනිසාගෙන් වෙන් කෙරුණු භාණ්ඩයකි. මෙය තරමක් පැටලිලි සහගත විය හැකි ය. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ඒ පැටලිල්ලක් නො වෙයි. මිනිස්සු යම් සංස්කෘතියකට අයත් වෙති. ඒ අතර සංස්කෘතිය ඇත්තේ මිනිසාගෙන් පරිබාහිරව ය.

මිනිසාගෙන් පරිබාහිරව සංස්කෘතිය ඇත්තේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් අනෙක් දෑ මෙන් ම සංස්කෘතිය ද මිනිසාගෙන් වෙන් කෙරී ඇති බැවිනි. වෙන්කිරීම ආත්මය වූ සංස්කෘතියක සංස්කෘතිය ද වෙන් නොකෙරෙන්නේ නම් පුදුමයකි. පැරණි සමාජවල එවැනි තත්වයක් නො වී ය. එහි සංස්කෘතීන් මිනිසාගෙන් වෙන්කරනු නො ලැබිණි. මිනිසුන් යම් සංස්කෘතියකට අයත් වී නම් ඒ සංස්කෘතිය මිනිසුන්ගේ ඓන්ද්‍රීය අංගයක් විය. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි කටයුතු සිද්ධවන්නේ එලෙස නො වේ.

© Prof. Nalin De Silva

සංස්කෘතිය ද වෙන් කෙරුණු පසු ඒ වෙළෙඳ සැලෙහි ද, රූපවාහිනියෙහි ද, පුවත්පත්වල ද අලෙවි කෙරෙයි. බටහිර ක්‍රිස්තියානි රටවල නත්තල පාස්කුව ආදිය ද අලෙවි වෙයි. නත්තල උත්සවයක් පැවැත්වීමේ දී ඒ උත්සවයට අසවල් අසවල් දෑ මිල දී ගැනීමට බලකරනු ලැබෙයි. එසේ බලකෙරෙන්නේ නීතියෙන් නොව සංස්කෘතියෙනි. සංස්කෘතිය විසින් ම මේ මේ දේ මේ අයුරින් සිදුවිය යුතු යැයි නියම වී ඇති බැවින් ඒ ඒ දෑ තමන් නිර්මාණය නොකරන බැවින් ඒ වෙළෙඳපොළෙන් මිළ දී ගැනීමට සිදුවෙයි. එලෙස ගත්කල සංස්කෘතිය සංස්කෘතිය විසින් ම අලෙවි කෙරෙයි.

මෙය අද බටහිර රටවලට පමණක් සීමා වී නැත. අප වැනි රටවල බටහිර යුදෙව් ක්‍රිස්තියානි නොවන සංස්කෘති ද අලෙවි වෙයි. අවුරුද්දට, වෙසක් දිනවලට සංස්කෘතිය මිළ දී ගැනීමට අපට නියම කෙරෙයි. අප අපේ සංස්කෘතියට අයත් වුවත් අපි යම් ප්‍රමාණයකට බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ද අයත් වෙමු. බටහිර සංස්කෘතිය යම් පමණකට අපට බලෙන් ලබා දී ඇත. අපට අපේ සංස්කෘතියෙන් ද වෙන්වීමට බලකෙරෙන්නේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් මිස සිංහල බෞද්ධ සංස්කෘතියෙන් නො වේ.

අපි එක්විට සංස්කෘතික දෙකකට අනුගත ව වැඩකිරීමට උත්සාහ කරමු. මෙය ද භින්නෝන්මාදයකට තුඩු දෙන්නක් විය හැකි ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි සංස්කෘතිය මිනිසාගෙන් වෙන් නො කෙරෙයි. එහෙත් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සංස්කෘතිය මිනිසාගෙන් වෙන් කෙරෙයි. මේ හේතුවෙන් අපි සිංහල බෞද්ධ සංස්කෘතියෙන් ද වෙන් කෙරෙන්නෙමු. එහෙත් අපි ඒ සමඟ එක්වීමට වෙනත් ක්‍රම යොදා ගනිමු. අපි සරල උදාහරණයක් ගනිමු. අද නගරවල වෙසෙන්නෝ ගැමි සංස්කෘතියෙන් වෙන්කරනු ලැබ සිටිති. (ඇතැම්විට ගැමියෝ ද ගැමි සංස්කෘතියෙන් වෙන් කෙරෙති.) එහෙත් අපට ගමට යෑමට ඒ සංස්කෘතිය විඳ ගැනීමට ඇතැම්විට රූපවාහිනිය උපකාරි වෙයි. ඇතැම් විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ම තරු පහේ හෝටල් ඒ සඳහා ආධාර කරනු දක්නට හැකි ය. එවැනි ඇතැම් ආපන ශාලාවල ගමේ කඩේ යැයි කියැවෙන තැනක් නිර්මාණය වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ තරු පහේ හෝටලයකින් අද අපෙන් වෙන් කරනු ලැබූ ගැමි සංස්කෘතිය මිළ දී ගත හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva